# බළන්ගොඩ නගර සභා විශේෂ මහා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2011.01.06

වේලාව : ප.ව.03.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.විමලසේන මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ජී.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 06. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රුමි මැතිතුමා |
| 07. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 08. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රුමි මැතිතුමා |

**සහභාගීනොවූවෝ:-**

| | |
|---|---|
| 01. ගරු උපසභාපති | සුමේද චාමින්ද බස්නායක මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | යූ.එච්. ගාමිණී මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ආර්.ඩී.නලින් පුෂ්පකුමාර | ලේකම් |

(01) **ආගම සිහිකිරිම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

අද දින පැවැත්වෙන විශේෂ මහා සභා රැස්වීමට සහභාගීවීමට පැමිණ සිටින ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා සහ ලේකම් මහතා සාදරයෙන් පිළිගන්නා බව පළමුවෙන් පැවසීය.

ඉන් අනතුරුව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා , පළාත් පාලන ආයතන වල ධූර කාලය වසරකින් දිර්ඝ කර තිබුණු අතර , එම කාලය ද අවසන්ව ඇති නිසා අද දින රාත්‍රියේ දී පළාත් පාලන ආයතන විසුරුවා හැරීමට බොහෝ දුරට ඉඩ ඇති නිසා , අත්‍යාවශ්‍ය කාරණා සම්බන්ධව තීරණ ගැනීම උදෙසා මෙම විශේෂ මහා සභා රැස්වීම කැඳවූ බැව් පැහැදිලි කරන ලදි.

දේශපාලන කටයුතු වල නිරතව විශාල කැපකිරීමක් සිදුකර ජනතාව වෙනුවෙන් වසර 20 ක් කාලයක් සේවය කර නැවතත් මැතිවරණයට මුහුණදීමට අවස්ථාව එළඹ ඇති බැව් පැවසීය. පසුගිය කාලය තුළ ජනතාව වෙනුවෙන් වගකීම් නිසි අයුරින් ඉටුකිරීමට හැකිවීම සම්බන්ධව තමන් අතිශයින් සතුටු වන අතර , එම මෙහෙවරට දායකත්වය ලබාදුන් මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන් ලේකම් මහතා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට සිය ප්‍රණාමය මේ අවස්ථාවේ දී පළකරන අතර ඔවුනගේ සේවය අගයමින් ඔවුන්ට ස්තුතිය පළකිරීමට සභා රැස්වීමෙන් පසුව අවස්ථාව සලසා ඇති බැව්ද සඳහන් කරන ලදී.

තව දුරටත් කථා කළ ගරු සභාපතිතුමා, සතිපොළ මෙම මස 08 වන දින විවෘත කිරීමට නියමිත අතර , ඒ සඳහා සහභාගීවන ලෙස ගරු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරමින් , සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## 05:01 **දේවිකා සමරනායක මියගේ නිවසට ජලය ගලාඒම**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ , තුඹගොඩ,සුදර්ශනගම, අංකඃ 82 දරණ ලිපිනයේ පදිංචි දේවිකා සමරනායක මිය විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

එමගින් සඳහන් කර ඇති කාරණා කෙරෙහි අවධානය යොමු කල සභාව , කාර්මික නිලධාරී මහතා ලවා ඇස්තමේන්තුවක් සකස් කර නොපමාව පැති බැම්ම සකස් කරදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

## 05:02 **බළන්ගොඩ නව බස්නැවතුම්පල C -08 දරණ කඩ කාමරය පෙර ගෙවීම් ක්‍රමයට බදු ලබාගැනීම**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ , බෝම්බුව, අංකඃ 148 දරණ ලිපිනයේ පදිංචි ලහිරු ෂාමල් වීරසිංහ යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

තක්සේරු මුදලට ලබාගෙන ඇති බළන්ගොඩ නව බස්නැවතුම්පලේ අංකඃC -08 දරණ කඩ කාමරය පෙර ගෙවීම් ක්‍රමයට ( කී මනි ) බදු ලබාදෙන ලෙස ඉහත ලිපියෙන් ඉල්ලා තිබිණ.

බළන්ගොඩ බස්නැවතුම්පල අංක C -08 දරණ කඩ කාමරය විදුලිබල මණ්ඩලයේ අවශ්‍යතාවයන් සඳහා සකස් කරන ලද බැවින් මෙම කඩ කාමරය තක්සේරු කිරීම සිදුනොකල බවත් , නමුත් දීර්ඝ කාලයක් මෙය වසා තිබීම නිසා විදුලි බල මණ්ඩලයට මෙය අවශ්‍ය නොවන බැව් පෙනීගිය බැවින් , සභාවට ආදායම් ලබාගැනීම අරමුණු කරගෙන ඊට යාබද C කාණ්ඩයේ කඩ කාමර සඳහා අයකරනු ලබන තක්සේරු මුදල පදනම් කරගෙන ටෙන්ඩර් කිරීමකින් තොරව ඉහත සඳහන් අය වෙත බදු ලබාදුන් බව ගරු සභාපතිතුමා විසින් පැවසීය. ඔහු විසින් දීර්ඝ කාලයක් මෙය භුක්ති විදින බැවින් , කීමනි මුදලක් තක්සේරු කර ඔහු වෙත මෙය ලබාදීම සුදුසු බව එතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු ප්‍රධාන අමාත්‍යතුමන්ගේ අනුමැතියට යටත්ව ටෙන්ඩර් කිරීමකින් තොරව එයට යාබඳව පිහිටා ඇති කඩ කාමරයේ තක්සේරු මුදල පදනම් කරගෙන කීමනි මුදල් ක්‍රමයට දැනට බදු ගෙන සිටින අයට ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

මෙම අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා සභා ගර්භයේ නොසිටියහ.

## 05:03 2011 වර්ෂයේ සැපයුම්කරුවන් වශයෙන් ලියාපදිංචිවී ඇති සැපයුම්කරුවන්ගේ නාම ලේඛනය

මෙම නගර සභාවේ 2011 වර්ෂයේ සැපයුම්කරුවන් වශයෙන් ලියාපදිංචිවී ඇති සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයක් සභාවට ඉදිරිපත් කරන ලදී. මොවුන් 2011 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

| අනු අංකය | ආයතනයේ නම | සැපයුම් ඓතමය |
|---|---|---|
| 01 | නිව් ජෝති ස්ටෝර්ස් - බළන්ගොඩ | කාර්යාල උපකරණ සහ ලිපි ද්‍රව්‍ය |
| 02 | මල්බෝ ට්‍රේඩින් කම්පැණි - කොළඹ | සියළුම වර්ගයේ විදුලි උපකරණ |
| 03 | කර්ස්වේ ජේන්ට් ලංකා - පානදුර | සියළුම වර්ගයේ තීන්ත වර්ග |
| 04 | ලල්ලන්ස් ස්පෝට් ගුඩ්ස් - රත්නපුර | ක්‍රීඩා භාණ්ඩ සියළුම වර්ගයේ වානේ උපකරණ |
| 05 | ගොඩගේ පොත් මැදුර - මරදාන | පුස්තකාල පොත් |
| 06 | ඒෂියන් බලෙක්ට්‍රිකල්ස් - කොළඹ | විදුලි උපකරණ |
| 07 | පෙරේරා වයර් සර්විස් - මාලඹේ | වාහන අමතර කොටස් - ටයර් ටියුබ් |
| 08 | හිඩෙකි ඉන්ටර් නැෂනල් - කොළඹ | කාර්යාල උපකරණ |
| 09 | එන්ට්ලර් ඉන්ඩස්ට්‍රීස් - පිළියන්දල | සෞඛ්‍ය උපකරණ සහ විෂ බීජ නාෂක ද්‍රව්‍ය |
| 10 | ස්ටාර් ස්පොට්ස් - කොළඹ | ක්‍රීඩා උපකරණ සහ අනෙකුත් උපකරණ |
| 11 | සෙන්ට්‍රල් ඉලෙක්ට්‍රිකල්ස් - කොළඹ | විදුලි උපකරණ |
| 12 | රිෂානා සර්විස් ස්ටේෂන් - බළන්ගොඩ | වාහන සේවා සහ අමතර කොටස් |
| 13 | ස්වදේශ් ට්‍රේඩිං ඕඩියෝ විෂුවල් - කොළඹ | කාර්යාල උපකරණ |
| 14 | ජුම්මානාහ් එන්ටර්ප්‍රයිසස් - කොළඹ | විදුලි උපකරණ |
| 15 | බිටුමික්ස් පුද්ගලික සමාගම - හෝමාගම | සියළුම වර්ගයේ තාර වර්ග |
| 16 | ජෝන් කීල්ස් ඔෆිස් - කොළඹ | කාර්යාලයීය උපකරණ |
| 17 | රොබට් ඒජන්සීස් - කොළඹ | කාර්යාලයීය උපකරණ |
| 18 | කොළෝනියල් ඉංජිනියරින් - කොළඹ | ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය |
| 19 | හීරෝ ටෙක්ස් - කොළඹ | නිල ඇඳුම් රෙදි |
| 20 | මැෂින් ඉම්පැක්ස් - කොළඹ | විදුලි උපකරණ |
| 21 | ලකී පර්නිචර්ස් - නුවර | වානේ ගෘහ භාන්ඩ හා ලී බඩු |
| 22 | සමයවර්ධන පොත්හල - කොළඹ | පුස්තකාල පොත් රබර් සීල් හා ලිපි ද්‍රව්‍ය |
| 23 | ටාටා ටෙක්ස් - කොළඹ | නිල ඇඳුම් රෙදි |
| 24 | තෙඹුවන ගරාජ් - ඕලුගංතොට | වාහන අළුත් වැඩියාව |
| 25 | මෙට්‍රොපොලිටන් - රත්නපුර | ඡායා පිටපත් යන්ත්‍ර අළුත් වැඩියාව |
| 26 | අනුරසිරි ෆර්නිචර්ස් - මහනුවර | වානේ ගෘහ භාණ්ඩ හා ලී බඩු |
| 27 | සුදේශ් කන්ස්ට්‍රක්ෂන්ස් - කුරුණෑගල | කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන |
| 28 | බෙනඩික් සහ සමාගම - කොළඹ | වාහන ටයර් සහ ටියුබ් |
| 29 | ප්‍රබානෝ ඉන්ට්‍රා ට්‍රේඩර්ස් - කොළඹ | සෞඛ්‍ය උපකරණ |
| 30 | හයි ලයින් ටයර් සර්විස් - කොළඹ | ටයර් ටියුබ් සැපයීම |
| 31 | ඔටෝ බොක්ස් - කොළඹ | ටයර් ටියුබ් සැපයීම |
| 32 | යූ ඇන්ඩ් එච් වීල් සර්විස් - කොළඹ | ටයර් ටියුබ් සැපයීම |
| 33 | ඊඑම්පී පීවීසී ටෙක්නොලොජි - හෝමාගම | විදුලි උපකරණ |
| 34 | සිල්වර් ලයින් ඉලෙක්ට්‍රිකල්ස් - | විදුලි උපකරණ |
| 35 | ලැප්රෝ ටෙක්නොලොජි - කොළඹ | පරිගණක පරිගණක උපාංග |
| 36 | සන් සුපර් එන්ටර්ප්‍රයිසස් - තලවතුගොඩ | වානේ ගෘහ භාණ්ඩ |
| 37 | කොල්ට් ට්‍රේඩිං කම්පැණි - කොළඹ | කාර්යාලයීය උපකරණ |
| 38 | නිව් ශාස්ත්‍රෝදය ප්‍රින්ටර්ස් - කුලියාපිටිය | මුද්‍රණ කටයුතු |

| | | |
|---|---|---|
| 39 | ඊ-විස් ඉන්ෆොමේෂන් - කොළඹ | ඡායා පිටපත් යන්ත්‍ර අළුත්වැඩියාව<br>පරිගණක උපාංග ටෝනර් හා තීන්ත<br>පරිගණක මෘදුකාංග<br>මුද්‍රණ කටයුතු සහ රබර් සීල් |
| 40 | ආසිරි මුද්‍රණ හා ප්‍රකාශන සමාගම - කැළණිය | මුද්‍රණ කටයුතු |
| 41 | එඩිසන් ඉලෙක්ට්‍රිකල්ස් - කොළඹ | විදුලි උපකරණ |
| 42 | ලිතුමෙතාස් කම්පැණි - කොළඹ | නිල ඇඳුම් සඳහා රෙදි |
| 43 | ලල්ලන්ස් ඉංජිනියරින් - පන්නිපිටිය | ළමා උද්‍යාන උපකරණ |
| 44 | නිව් ශාස්ත්‍රෝදය මුද්‍රණාලය - කුලියාපිටිය | මුද්‍රිත ෆෝරම |
| 45 | ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් - කොළඹ | වානේ ගෘහ භාණ්ඩ |
| 46 | ඩයනමික් ඒ වී ටෙක්නොලොජි - කොළඹ | කාර්යාල උපකරණ<br>පරිගණක පරිගණක උපාංග |
| 47 | බීඑම්සීපී බාලසූරිය - වාද්දුව | සෞඛ්‍ය උපකරණ හා විෂ බීජ නාශක |
| 48 | පී සී සිස්ටම් - බළන්ගොඩ | පරිගණක පරිගණක උපාංග හා මුද්‍රණ<br>තීන්ත<br>සීඩී තැටි ටෝනර් කාට්රිජ් සහ රිබන්<br>පරිගණක මෘදුකාංග |
| 49 | ජී.ඩබ්.ඉන්ද්‍රලාල් - බළන්ගොඩ | වාලි සැපයීම |
| 50 | සේරසිංහ ප්‍රින්ටර්ස් - බළන්ගොඩ | මුද්‍රණ කටයුතු |
| 51 | නීට් ලංකා පුද් සමාගම - කොළඹ | පරිගණක පරිගණක උපාංග<br>පරිගණක මුද්‍රණ තීන්ත |
| 52 | ෆෙන්කොම් ටෙක්නොලොජි - කොළඹ | පරිගණක පරිගණක උපාංග<br>පරිගණක මුද්‍රණ තීන්ත |
| 53 | ඩී.ආර්.ඉන්ඩස්ට්‍රීස් - රත්නපුර | වානේ ගෘහභාණ්ඩ සහ ලී බඩු |
| 54 | නිව් ඔලිම්පික් ටයර් සර්විස් - රත්නපුර | ටයර් ටියුබ් සැපයීම |
| 55 | නිව් රෝයල් ටිම්බර්ස් - බළන්ගොඩ | දැව වර්ග සැපයීම |
| 56 | ජෝති ස්ටෝර්ස් - බළන්ගොඩ | කාර්යාලයීය ලිපි ද්‍රව්‍ය සහ උපකරණ |
| 57 | සීසාන් ඉලෙක්ට්‍රික් කම්පැණි - කොළඹ | විදුලි උපකරණ |
| 58 | ජාන් කම්පියුටර් සර්විස් - බළන්ගොඩ | පරිගණක පරිගණක උපාංග<br>පරිගණක මෘදුකාංග |
| 59 | එස්.බී ප්‍රින්ටර්ස් - මීගමුව | මුද්‍රණ කටයුතු සහ මුද්‍රිත පෝරම |

05:04 **කාර්ය මණ්ඩලය සඳහා අමතර දීමනාවක් ලබාගැනීම**

බළන්ගොඩ නගර සභා තානායමේ සේවය කරන වේටර්වරුන් හා මුළුතැන්ගෙයි කාර්ය මණ්ඩලයට මංගල සාද පැවැත්වෙන දිනයන් සඳහා අමතරව රු.500/- ක දීමනාවක් ලබාදීමට අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා බළන්ගොඩ නගර සභා තානායමේ කළමණාකරු විසින් ඉදිරිපත් කර ඇති 2011.01.06 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:05 2010.08.10 දින සිට 2010.12.31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා බළන්ගොඩ තානායමෙහි ලැබීම් හා ගෙවීම් වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| මුළු විකුණුම් | 4,944,130.90 |
| පිරිවැටුම් බදු | 123,603.20 |
| විකුණුම් පිරිවැය | 4,382,968.55 |
| **වෙනත් වියදම්** | **916,756.88** |
| **ශුද්ධ අලාභය** | **479,197.77** |

2010.08.10 දින සිට 2010.12.31 දින දක්වා රු.479,197.77 ක ශුද්ධ අලාභයක් පෙන්නුම් කර ඇති බැවින් එය වළක්වා ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමුකර මේ සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීම මැනවි යැයි ලේකම් මහතා විසින් දන්වන ලද අතර , ඉදිරියේ දී පළාත් පාලන ආයතන විසුරුවා හැරීමට නියමිත බැවින් එම කාලය තුළ තානායම පවත්වාගෙන යන ආකාරය සම්බන්ධව තීරණයක් ගත යුතු බවද ලේකම් මහතා විසින් සභාව වෙත දැණුම් දෙන ලදී.

තානායම සඳහා වැයවන ජලය හා බිල්පත් බිල්පත් ගෙවීමට යටත්ව සාධාරණ මුදලක් මාසික ගෙවීමට යටත්ව කළමණාකරු වෙත තානායම පවත්වාගෙන යාම අතුරු බඳුදීමක් සිදුකිරීම සුදුසු බැව් ගරු සභාපතිතුමන් විසින් දැන්විය.

ඉදිරියේ දී මැතිවරණයක් පැවැත්වීමට නියමිත වන බැවින් , විවිධ අක්‍රමිකතා සිදුවිය හැකි බැවින් , එයින් සභාවේ ගෞරවයට හානියක් සිදුවිය හැකි නිසා මෙය නගර සභාව මගින් පාලනය විය යුතු බැව් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් දැන්විය.

තානායම සම්බන්ධව ගනු ලබන තීරණ වලින් නිදහස් කරන ලෙස ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.විමලසේන මැතිතුමන් විසින් ඉල්ලා සිටින ලදී.

මේ සම්බන්ධව තවදුරටත් සාකච්ඡා කිරීමෙන් අනතුරුව මෙම සභාවේ අධීක්ෂණය හා පාලනය යටතේ තානායම පවත්වාගෙන යාමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

- සතිපොලෙහි ආපන ශාලාව ජලය හා විදුලිය බිල්පත් පියවීමට යටත්ව තක්සේරු මුදලට නගරසභා යහ සාධක සංගමය මගින් පවත්වාගෙන යාමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.
- මෙම මස 08 වන දින නිල වශයෙන් සතිපොළ විවෘත කිරීමට පසුගිය සභාවේ දී සාකච්ඡා වූ බවත් , නමුත් 09 සිට පොලේ වෙළඳාම් කටයුතු සිදුවන බැව් දැනගැනීමට ලැබුණු බවත්, එසේ කිරීමෙන් වෙළඳුන් අතර මහත් අරබුදකාරී ත්ත්වයක් නිර්මාණය විය හැකි බැව්ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් පවසන ලදී. එසේ බුලත් වෙළඳුන් හට කඩ කාමර 10 ක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කළ බවත් , එය ලබාදීම සිදුවිය යුතු බැව් දැන්වීය.

- 2011 වර්ෂයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ට රු.ලක්ෂය බැගින් ලබාදීමට අයවැය මගින් ප්‍රතිපාදන සලසා ඇති නිසා , උඩ ඇල්ලෙපොල කොට බෝධිය අසල පැති බැම්ම ඉදිකිරීම කර්මාන්තයේ ඉතිරි වැඩ කොටස ඉටුකරගැනීම සඳහා එම මුදල ලබාදෙන ලෙස ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

- බෝම්බුව නිල්වල ක්‍රීඩාපිටිය සංවර්ධනය සඳහා ලක්ෂය මුදලක් ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කුමාරගම පුපුලවත්ත ගමට යන මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම සඳහා රු.ලක්ෂයක මුදලක් ලබාදෙන ලෙස ගරු නාගරික මන්ත්‍රී , එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ඉල්ලා සිටින ලදී

**06. අවසානයඃ**

**ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාඃ**

අද දින විශේෂ මහා සභා රැස්වීමේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන්ටත්, ලේකම් මහතාටත් සිය ස්තුතිය ප්‍රකාශ කරමින්, සභාවේ වැඩ කටයුතු ප.ව. 4.30 ට පමණ අවසන් කරන ලදී.

ආර්.ඩී.නලින් පුෂ්පකුමාර,
ලේකම්,
බළන්ගොඩ නගර සභාව.